# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,613— 1966 ජනවාරි 7 වැනි සිකුරාද 1966.1.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 1 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. | — |
| තනතුරු-ඇබෑර්තු .. .. .. .. | — | අය-වැය ලේඛන .. .. .. | 2 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. | — | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | — | මාර්ග කොමිටි දැන්වීම .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — | විවිධ දැන්වීම .. .. | 4 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 138/30.

### මහා නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 163(2) වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවන ලද ආඥාවයි.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරවරයාගේ ලේකම්.

1965 දෙසැම්බර් 2 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

මහා නගර මහෙස්ත්‍රාත්වරුන්ගේ අධිකරණ බලය (269 වැනි අධිකාරය වන) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත යටතේ වූ සියලුම වරදවල් ඇතුළත් වන පරිදි මෙයින් ව්‍යාප්ත කරනු ලැබේ.



ඇල්.ඩී.—බී. 139/46
ප. පා. දෙ.—ඒ/8.

### මාතලේ මහ නගර සභාව

#### විනෝද බදු ආඥා පනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මාතලේ මහ නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත සඳහන් යෝජනාව පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ එකී වගන්තියේ (2) වැනි උපවගන්තිය ප්‍රකාර ප්‍රසිද්ධ කරනු ලැබේ.

#### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙම සභාව විසින් එහි පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පවත්වනු ලබන (ආඥාපනතින් විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා ප්‍රවේශවීම පිණිස අය කරනු ලබන ගෙවීම්වලින් පහත දක්වා ඇති ප්‍රමාණ අනුව බද්දක් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මෙයින් පනවා අයකරනු ලැබේ.

### විශෙෂ නිවේදනයයි

1966 ජනවාරි 20 වැනි බ්‍රහස්පතින්දා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1966 ජනවාරි 21 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1966 ජනවාරි 16 වැනි ඉරිදා ප. ව. 3.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1966 ජනවාරි 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


—බී 63572—4,997 (65/12)

| බදු මුදල් ප්‍රමාණය හැර ප්‍රවේශවීම සඳහා ගෙවිය යුතු ප්‍රමාණය | | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|---|
| (අ) ශත 19 කට වැඩි නමුත් ශත 39 කට නොවැඩි වන විට | ... | 0 05 |
| (ආ) ශත 39 කට වැඩි නමුත් ශත 59 කට නොවැඩි වන විට | ... | 0 10 |
| (ඇ) ශත 59 කට වැඩි නමුත් ශත 79 කට නොවැඩි වන විට | ... | 0 15 |
| (ඇ) ශත 79 කට වැඩි නමුත් ශත 99 කට නොවැඩි වන විට | ... | 0 20 |
| (ඉ) ශත 99 කට වැඩි නමුත් රු. 1.19 කට නොවැඩි වන විට | ... | 0 25 |
| (ඊ) රු. 1.19 කට වැඩි නමුත් රු. 1.39 කට නොවැඩි වන විට | ... | 0 30 |
| (උ) රු. 1.39 කට වැඩි නමුත් රු. 1.59 කට නොවැඩි වන විට | ... | 0 35 |
| (ඌ) රු. 1.59 කට වැඩි නමුත් රු. 1.79 කට නොවැඩි වන විට | ... | 0 40 |
| (එ) රු. 1.79 කට වැඩි නමුත් රු. 1.99 කට නොවැඩි වන විට | ... | 0 45 |
| (ඒ) රු. 1.99 කට වැඩි නමුත් රු. 2.49 කට නොවැඩි වන විට | ... | 0 50 |
| (ඔ) රු. 2.49 කට වැඩි නමුත් රු. 2.99 කට නොවැඩි වන විට | ... | 0 60 |
| (ඖ) රු. 2.99 කට වැඩි නමුත් රු. 3.49 කට නොවැඩි වන විට | ... | 0 75 |

| බදු මුදල් ප්‍රමාණය හැර ප්‍රවේශවීම සඳහා ගෙවිය සුතු ප්‍රමාණය | | ප්‍රම රු |
|---|---|---|
| (ක) රු. 3.49 කට වැඩි නමුත් රු. 3.99 කට නොවැඩි වන විට | ... | |
| (ග) රු. 3.99 කට වැඩි නමුත් රු. 4.49 කට නොවැඩි වන විට | ... | |
| (ච) රු. 5.00ක් වන විට ... ... | ... | |
| (ජ) රු. 5.00 කට වැඩි වන විට— | | |
| (i) පළමුවැනි රු. 5.00ට ... | ... | |
| (ii) එක් එක් අතිරේක රු. 1.00ට හෝ ඉන් කොටසකට | | |

ඒ. ටී. ගොගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේක

1965 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

1–54—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 39/52
ප.පා. දෙ.—ජී.බී.8/1/24

**ගම්සභා ආඥාපනත**

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965.11.30 වැනි දින,
කොළඹ දී ය.

**ආඥාව**

ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන් ගාලු දිස්ත්‍රික්කයේ තෙලිකඩ මාජුවානා ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බ යෙන් අදාල නොවිය යුතු යයි ප්‍රකාශයට පත් කරමින්, 1953 නොවැ 27 වැනි දින අංක 10,616 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව මෙ අවලංගු කරනු ලැබේ.

1–57—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

**13 වන වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර, (ඉහළ) මධ්‍යම දිශාවේ සහකාර පළාත් පාලන කොමසාරිස් බර්ටි ලියනමාන වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරලේ ගම්සභාවෙහි අංක 13 දරණ කොට්ඨාශයෙහි සභික ගල්පොත්තේ ගෙදර, ආරියපාල මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරාපත් කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරලේ ගම්සභාවෙහි අංක 13 දරණ කොට්ඨාශයෙහි සභික ගල්පොත් ගෙදර ආරියපාල මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දින තම සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

බර්ටි ලියනමාන,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(ඉහළ) මධ්‍යම දිශාව.

1965 දෙසැම්බර් මස 22 දින,
මාතලේ දී ය.

1–65–1085/2—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## නිවැරදි කිරීමයි

**ගම්සභා ආඥාපනත**

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1965 අගෝස්තු 20 වැනි දින අංක 14,486 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ 606 වැනි පිටුවේ පළවී ඇති බදුල්ල දිස්ත්‍රික්ක කැප්පෙටිපොල ගම්සභාවේ සභික ඊ. ඇම්. ඩබ්ලිව්. ගවරම්මාන මහතා පිළිබඳ දැන්වීමේ 7 වැනි පේලියේ සඳහන් ගම්සභා කොට්ඨාශ අංකය නොව " අංක 11 " කියා කියවිය යුතුයි.

8–785—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව

**කෙවැනි අතිරේක අය-වැය ලේඛනය—1965**

| වැය ශීර්ෂය | | | මුදල රු. | ශ. | අනුග්‍රාහක බලය |
|---|---|---|---|---|---|
| ඒ.—2 (ඒ) අමතර දීමනා | ... | ... | 700 | 0 | 1965.12.18 දින රැස්වීමේ සම්මුති අංක 10. |
| බී.—1(බී) වැටුප්, ඕවර්සියර්වරු | ... | ... | 450 | 0 | එම |
| බී.—1 (සී) කම්කරු වැටුප් | ... | ... | 100 | 0 | එම |
| බී.—13 ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | ... | ... | 1,025 | 0 | එම |
| ඩී.—8 ජීවනාධාර හා විශේෂ ජීවනාධාර | ... | ... | 10 | 0 | එම |
| ජේ.—1 (සී) වැඩ සඳහා වැටුප් | ... | ... | 50 | 0 | එම |
| | එකතුව | ... | 2,335 | 0 | |

ඇස්. ජී. ඒ. ද සිල්වා,
අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

1965 ක්වූ දෙසැම්බර් මස 28 වැනි දින,
අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

1–73—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

## හොරණ නගර සභාව

### අතිරේක අය- වැය ලේඛනය අංක 3—1965

| වැය ශීර්ෂය | | මුදල රු. | ශ. | | යෝජනා අංකය |
|---|---|---|---|---|---|
| ඒ.—1 (ඒ) | ... | 150 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඒ.—2 (ඒ) | ... | 225 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඒ.—2 (ඊ) | ... | 500 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඒ.—2 (ඇෆ්) | ... | 1,500 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |
| | | 1,500 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඒ.—2 (කේ) | ... | 1,500 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| බී.—3 | ... | 150 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |
| සී.—2 | ... | 1,200 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |
| ඩී.—8 | ... | 5,000 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඊ.—2 (ඒ) | ... | 200 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| | | 200 | 0 | ... | 1965.12.11 දින යෝජනා අංක 15 |
| ඊ.—3 (ඒ) | ... | 150 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| | | 200 | 0 | ... | 1965.12.11 දින යෝජනා අංක 15 |
| ඊ.—3 (බී) | ... | 250 | 0 | ... | 1965.12.11 දින යෝජනා අංක 15 |
| ඊ.—3 (ඊ) | ... | 300 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |
| ඊ.—7 (බී) | ... | 1,000 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |
| ජී.—1 | ... | 75 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ජේ.—4 (ඒ) | ... | 125 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ජේ.—4 (ඩී) | ... | 2,000 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඇම්.—2 | ... | 1,500 | 0 | ... | 1965.11.27 දින යෝජනා අංක 7 |
| ඇම්.—4 | ... | 1,000 | 0 | ... | 1965.10.13 දින යෝජනා අංක 8 |

1965.10!13, 1965.11.27 සහ 1965.12.11 යන දිනවල පවත්වන ලද රැස්වීම්වලදී සම්මත කර ගන්නා ලදී.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

නගර සභා කාර්‍යාලය,
හොරණ, 1965.12.28.

1–67–66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## වලස්මුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (2) දරණ කොටස යටතේ අයදුම්පත

### 1965 අය-වැය ලේඛනය

### 1 වැනි කොටස—සාමාන්‍ය

1965 වර්ෂයේ අය වැය ලේඛනයේ මුදල් ඉතුරුවේයයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා ගිය ශීර්ෂයන්ට මෙහි පහත පෙන්වන පරිදි මුදල් මාරුකිරීමට, 1965 ක්වූ දෙසැම්බර් මස 24 වැනි දින පවත්වන්ට යෙදුන විශේෂ රැස්වීමේ අංක 2 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

| ඉතිරි වැය ශීර්ෂය | | රු. | ශ. |
|---|---|---|---|
| ඩී.—1 (එන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන | ... | 537 | 25 |
| ඩී.—3 (ජී) අත්පත්කර ගැනීම් | ... | 200 | 0 |
| ඩී.—3 (එච්) ඉදිකිරීම් | ... | 50 | 0 |
| ඩී.—5 (ඩී) ඉඩම් සතුවට ගැණීම් | ... | 500 | 0 |
| එකතුව | ... | 1,287 | 25 |

| වැඩිපුර වියදම් වැය ශීර්ෂය | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ.—2 (බී) ගමන් ගාස්තු | ... | 150 | 0 |
| ඒ.—2 (ඇප්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශන හා මුද්දර ගාස්තු | ... | 12 | 0 |
| ඒ.—2 (ජී) රථ වාහන සහ ඔරු තහඩු ගාස්තු | ... | 2 | 08 |
| ඒ.—2 (එච්) ගණන් පරීක්ෂක ගාස්තු | ... | 533 | 28 |
| ඩී.—2 (ඒ) දෛනික වැටුප් | ... | 567 | 41 |
| ඩී.—3 (ඒ) දෛනික වැටුප් | ... | 22 | 48 |
| එකතුව | ... | 1,287 | 0 |

ඇස්. ද ඇස්. ලියනගේ,
සභාපති,
වලස්මුල්ල සුළු නගර සභාව.

1965.12.27 වැනි දින.

අනුමත කරමි.

එච්. ජී. පී. අභයවර්ධන,
පලාත් පාලන සහකාර කොමසාරිස්, මාතර.

1965 දෙසැම්බර 28.

1-72-66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## කැළණිය සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් නියෝග අංක 40 (2) යටතේ කෙරෙන දෙවන අයදුම්පත්‍රයයි

### අය-වැය ලේඛනය

1965 අයවැය ලේඛනයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේ යයි ගණන් බලන ලද මුදල් අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක මුදල් පියවා ගැනීම සඳහා යෙදවීමට 1965 නොවැම්බර් මස 30 වැනි දින පවත්වනු ලැබූ කැළණිය සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 6 දරණ යෝජනා ස්ථිරත්වයෙන් පහත සඳහන් අන්දමට සම්මත කර ගන්නා ලදී:

### පළමුවැනි කොටස (සාමාන්‍ය අංශය)

| ඉතිරි කරගත් ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|
| ඊ.—1 (බී) ලිපිකරුවන් ... | ... | 2,000 | 0 |
| ඊ.—2 (සී) බදු එකතු කරන්නන්ගේ කොමිස් | ... | 3,823 | 0 |
| එකතුව | ... | 5,823 | 0 |

| වැඩිපුර වැය ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ.—1 (ඒ) ලේකම් | ... | 121 | 0 |
| ඒ.—1 (ඩී) කාර්යාල කාර්ය සහායකවරුන් | ... | 15 | 0 |
| ඒ.—2 (බී) ප්‍රවාහණ දීමනා | ... | 100 | 0 |
| ඒ.—2 (ඇප්) ලිපිද්‍රව්‍ය ආදිය | ... | 2,000 | 0 |
| ඒ.—2 (ජේ) අනියම් වියදම් | ... | 500 | 0 |
| බී.—8 සංවර්ධනය | ... | 1,862 | 0 |
| ඩී.—3 (සී) ගබඩා බඩු | ... | 68 | 0 |
| ඩී.—5 (සී) නඩත්තුව | ... | 175 | 0 |
| ඩී.—5 (එච්) ඉදිකිරීම් | ... | 231 | 0 |
| ඇප්.—2 නඩත්තුව | ... | 112 | 0 |
| ජේ.—6 ජීවනාධාර | ... | 639 | 0 |
| එකතුව | ... | 5,823 | 0 |

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

කැළණිය සුළු නගර සභා කාර්‍යාලය,
කැළණිය,
1965 දෙසැම්බර් මස 2 වන දින දිය.

අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස්,
බටහිර කොට්ඨාශය.

1965 දෙසැම්බර් මස 28 දින දිය.

1–42–66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## වැලිගම නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන වැලිගම නගර සභා සීමාව තුල යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණු මතයයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත දී මාවෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳම |
|---|---|
| 1. ඇම්. ඇස්. ඇම්. සනූන්, මදුරා ගොඩ, වැලිගම | වැලිගම ගල්බොක්ක වෙළ පොලේ ගවමස් වෙළඳ ස ගවමස් වෙළඳාම |
| 2. ඇම්. ඇස්. ඇම්. සනූන්, මදුරා ගොඩ, වැලිගම | වැලිගම ගල්බොක්ක වෙළඳ පොලේ එළුමස් වෙළඳ සැ එළුමස් වෙළඳාම |

ම. ප. ලීලාරත්න,
සභාපති,
වැලිගම නගර සභාව.

1965 දෙසැම්බර් මස 29 දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

1–66—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1966 වර්ෂය සඳහා කසළ ශෝධක විශේෂ වරිපනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රකාශයට පත් කෙරෙන සීමාවනට හා අස් කිරීම්වලට යටත්ව පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන අයුරු සමාන කොටස හතරකින් ගෙවිය හැකි වන සේ ඉකුත් වූ වර්ෂයේ බලපැවැත්වෙමින් තිබුණ පරිදිම දෙවිනුවර සුළු නගර සභා සීමාව තුල පිහිටි නිශ්චල සියළුම දේපලවලින් සියයට හතර කසළ ශෝධක විශේෂ වරිපණම් බද්දක් 1966 වර්ෂය සඳහා දෙවිනුවර සු නගර සභාව විසින් පණවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබ

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර සුළු නගර සභාව

සුළු නගර සභා කාර්යාලය,
දෙවිනුවර.
1965 ක් වූ දෙසැම්බර් 27 දී ය.

1–63/1—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර උප නගර සභාව

### 1966 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 334 වැනි පරිච්ඡේදයේ 4 වැනි කොටසේ ප්‍රකාර දෙවිනුවර උප නගර සභා සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකුට රුපියල් (1 ක්) එකක් බැගින්ද, සෑම බැල්ලියකට රුපියල් එකයි ශත පණහක් (1.50) බැගින්ද 1966 වර්ෂයට අය කිරීමට පනවා ඇති බ එකී ගාසතු 1966 මාර්තු 31 වැනිදට හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවද මෙයි දැනුම් දෙනු ලැබේ.

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර උප නගර සභා

1965 දෙසැම්බර් මස 24 වැනි දින,
දෙවනුවර උප නගර සභා කාර්යාලයේ දී ය.

1–63/2—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර උප නගර සභාව

### උප නගර සභා ආඥාපනත

### 1966 වර්ෂයට දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) උප නගර සභා ආඥාපනත යටතේ මෙම ගත වී යන වර්ෂයට බලපවත්වන පහත නම සඳහන් වරිපනම් බදු දෙවිනුවර උප නගර සභා ප්‍රදේශය තුල 1966 වර්ෂයටද එලෙසම පැනවීමට දෙවිනුවර උප නගර සභාව තරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තියේ ප්‍රකාර මෙම උප නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකම්වලින් සියයට හයක් (6%) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 ස දෙසැම්බර් 31 වැනිදයන් අවසන්වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැ අයුරින්.

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර උප නගර සභාව.

1965 දෙසැම්බර් මස 24 වැනි දින,
දෙවිනුවර උප නගර සභා කාර්යාලයේ දී ය.

1–63/3—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර උප නගර සභාව

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද—1966

1946 අංක 3 දරණ උප නගර සභා ආඥාපණතේ 161 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛණයෙහි නම කරන ලද රථ වාහන වලට හා සතුන්ට ඒ ලේඛණයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙහි සඳහන් කර තිබෙන ගාස්තු 1966 වර්ෂයට පණවා ඇති බවත්,

2. යථෝක්ත ආඥාපණතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර උප නගර සභාව.

1965 දෙසැම්බර් මස 24 වැනි දින,
උප නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. ශ |
|---|---|
| මෝටර් කාර් රෝදත්‍රයේ මෝටර්කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත; ජන් රික්ෂෝ රථ, පාපැදි හැර වෙන ඕනෑම අන් මෙම වාහනයක් සඳහා ... ... ... | 5 |
| සෑම පාපැදියක්ම, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... ... | 5 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා... | 4 |
| තනි ගොනා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | 3 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... ... | 4 |
| සෑම ජන් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 |
| සෑම අශ්වයකු, සෑම අශ්ව පෝනියකු, සෑම කොටළුවකු සඳහා ... | 5 0 |
| සෑම ගොනකු හෝ බූරුවකු සඳහා ... ... | 1 0 |

1–63/4—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

## ගහළපල්ලේසිය පත්තුවේ ගම්සභාව

මාතලේ දිස්ත්‍රික්කයේ ගහළපල්ලේසිය පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එච්. ඇම්. උක්කුබණ්ඩා,
ගම්සභාවේ ප්‍රධාන තැන.

ගහළපල්ලේසිය පත්තුවේගම්සභා කාර්යාලය,
කෝන්ගහවෙල.

### යෝජනාව

1952 අංක 6 දරන ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ, 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ගහළපල්ලේසිය පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1954 ජූලි මස 16 වැනි දින අංක 10,693 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වන කාණ්ඩයේ (1) වන අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියේ දක්වෙන දැනට නඩත්තු කරන දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යා යුතු යයි කියා හේ. මු. ඉ. හීංබණ්ඩා නියෝජිත මහත්මයා කළ යෝජනාව ම. ව. අබේකෝන් බණ්ඩා නියෝජිත මහත්මයාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

| අංකය | කොට්ඨාශය | | පාරේ නම | දිග-පළල සැ. ද. අඩි |
|---|---|---|---|---|
| 2 ... | හැළඹගහවත්ත | (1) ... | දඹගොල්ල සිට කෝන්ගහවෙලට යන ප්‍ර. වැ. දෙ පාරේ හන්දියේ සිට හැළඹගහවත්ත ගම දක්වා පාර... | 0 40 40 |
| | | (2) ... | දඹගොල්ල සිට කෝන්ගහවෙලට යන ප්‍ර. වැ. දෙ. පාරේ සිට ඇළහැරට යන බිදුන්කඩේ දක්වා ගල්පඩි පාර | 4 0 40 |
| 3 ... | දඹගොල්ල | (1) ... | දඹගොල්ල ගමේ සිට ගල්පඩි පාරට වැටෙන ගොලුවැකොටුව පාර ... ... ... | 1 0 40 |
| | | (2) ... | දඹගොල්ල ගමේ සිට හැළඹගහවත්ත ගම දක්වා ගොඩයායේ පාර ... ... ... | 1 0 40 |
| | | (3) ... | දඹගොල්ල පාරේ සිට කලුන්ද පාරට වැටෙන පේරගහමුල යායේ පාර ... ... | 1 0 40 |
| 4 ... | බඹරගහවත්ත | (1) ... | හැළඹගහවත්ත හන්දියේ සිට ව. ප. ප. මායිමට වැටෙන කලුන්ද පාර ... ... | 4 0 40 |
| 5 ... | පූබ්බිළිය | ... | හැළඹගහවත්ත පාරේ හන්දියේ සිට පූබ්බිළිය පාඨශාලාව ළඟට වැටෙන රත්රන් බුබුල පිටිය පාර ... | 1 0 40 |
| 6 ... | මාරාගමුව | (1) ... | කෝන්ගහවෙලට යන ප්‍ර. වැ. දෙ. පාරේ සිට මාරාගමුව වෙල මැදින් යන ඔය දක්වා බණ්ඩරයායේ පාර... | 0 40 7 |
| | | (2) ... | මාරාගමුව ඔයේ සිට ව. ප. උ. ප ගම්සභා මායිම දක්වා හෙල මුදුනට බණ්ඩරයායේ පාර ... | 1 40 40 |
| | | (3) ... | ප්‍ර. වැ. දෙ. පාරේ සිට ඇලහැරට යන ප්‍ර. වැ. දෙ. පාරට වැටෙන ඇත්ගාලේ පාර ... ... | 1 0 40 |
| 7 ... | ඇළගමුව | (1) ... | ඇළහැරට යන ප්‍ර. වැ. දෙ. පාරේ සිට අඹන්ගඟ හරහා ඇළගමුව ගමට යන පාර ... ... | 0 40 40 |
| | | (2) ... | ඇළගමුව ගමේ සිට මොරගොල්ලට යන ගල්කඩුව පාර ... ... ... | 2 0 40 |
| | | (3) ... | ඇළගමුව ගමේ සිට ගල්බොඩට යන උඩ ගොබැල්ලේ පාර ... ... ... | 3 0 40 |
| | | (4) ... | ඇළගමුව ගම සිට කඹරවට යන ප්‍ර වැ. දෙ. පාරට වැටෙන මිල්ලගහරුප්ප පාර ... | 3 0 40 |
| 8 ... | තලාගොඩ | (1) ... | ඇළහැරට යන ප්‍ර. වැ. දෙ. පාරේ සිට තලාගොඩ ගමට යන පාර ... ... ... | 1 0 40 |
| | | (2) ... | තලාගොඩ සිට කඹරවට යන ප්‍ර. වැ. දෙ. පාරට වැටෙන නවනැළිය පාර ... ... | 0 40 40 |
| 9 ... | ගල්බොඩ | (1) ... | අඹන්ගඟේ අංක 1 පාළම ළඟ සිට ගල්බොඩට යන උඩගොඩැල්ලේ පාර ... ... | 2 0 40 |
| | | (2) ... | ගල්බොඩ සිට දම්මන්තැන්නට යන කඩමුදුනේ පාර ... ... ... | 2 0 40 |
| 10 ... | දම්මන්තැන්න | (1) ... | දම්මන්තැන්න ගම සිට ල. උ ප. ගම්සභා මායිමට වැටෙන පුවක්පිටියට යන පුස්වැල්කැටිය නොහොත් ඉල්ලගොල්ල පාර | 1 40 40 |
| | | (2) ... | දම්මන්තැන්න සිට ඇළගමුවට යන කලෝගහකටුව පාර ... ... ... | 4 0 40 |
| 11 ... | කෝන්ගහවෙල | (1) ... | කෝන්ගහවෙල කඩ මණ්ඩියේ සිට රදවෙල ගමට කුඩුමිරිස පාර ... ... ... | 1 0 40 |
| | | (2) ... | කෝන්ගහවෙල ප්‍ර. වැ. දෙ. පාරේ සිට රදවෙලට යන අලුත් කෙතේ පාර ... ... | 1 0 40 |
| 12 ... | රදවෙල | (1) ... | රදවෙල පන්සල ළඟ සිට අඹනට යන පෙනකැටැල්ලේ පාර අ. ග. කෝ. මායිමට ... ... | 2 40 40 |
| | | (2) ... | රදවෙල පන්සල ළඟ සිට අඹන්ගඟේ අංක 2 දරන පාළම දක්වා පාර ... ... | 1 0 40 |
| | | (3) ... | රදවෙල කලුගල්ලෑ ඔයේ පාළම ළඟ සිට මූකලන්යායේ වෙල් හරහා යන මූකලන්යායේ පාර ... | 1 20 20 |

1–50—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## කණුවන ගම් ප්‍රදේශයේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

එම බල පත්‍ර නිකුත්කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ කණුවන ගම් ප්‍රදේශයේ ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මස් කඩය පිහිටි ස්ථානය |
|---|---|
| 1. ජේ. ඒ. දෙන් විල්ප්‍රඩ්, බොල්ලතේ, ගනේමුල්ල | මාඵළිය අංක (2) මස් කඩය |
| 2. ඇම්. ෂෙරීෆ්, ගල්ඔළුව, මිනුවන්ගොඩ | කොටුගොඩ මස් කඩය |

ඇස්. පී. අමරසේකර,
කණුවන ගම් සභාවේ සභාපති.

ගම්සභා කායසිාලය,
කුඩැල්ල, ජාඇල.
22.12.1965.

1–51—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## හන්වැල්ල පේරුව ගම් සභාව

### මස පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින් 1966 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට හන්වැල්ල පේරුව ගම්ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

පී. පී. අත්තනායක,
හන්වැල්ල පේරුව ගම්සභාවේ සභාපති.

ගම්සභා කායසිාලය, හන්වැල්ල,
1965 දෙසැම්බර් මස 24 වැනි දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ජේ. නානායක්කාර | ... හරක් මස් ... | හන්වැල්ල මාර්කට්හි අංක 1 දරණ මස් කඩය |
| 2. ඇස්. ඇම්. තාහ | ... එළු මස් ... | හන්වැල්ල මාර්කට්හි අංක 2 දරණ මස් කඩය |
| 3. ඇස්. ඇම්. තාහ | ... හරක් මස් ... | හන්වැල්ල මාර්කට්හි අංක 3 දරණ මස් කඩය |
| 4. ඇම්. ඩී. තෝමස් අප්පුහාමි | ඌරු මස් ... | හන්වැල්ල මාර්කට්හි අංක 4 දරණ මස් කඩය |

1–53—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

## මැදපත්තු දකුණු ගම්සභාව—පොලොන්නරු දිස්ත්‍රික්කය

1947 අංක 44 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (සංශෝධිත) ආඥාපණතේ 6 වන ඡේදයෙන් සංශෝධිත වූ පරිදි, එම ආඥාපනතේ (201 වැ පරිච්ඡේදය) 7 වැනි ඡේදය යටතේ කෙරෙන දැනුම් දීමයි.

මෙහි පහත විස්තර කෙරෙන උපලේඛණයේ සඳහන් අයවළුන් විසින් ඒ ඒ ස්ථානයන්හි එළහරක් මස් වෙළඳාම පවත්වාගෙන යාම සඳහා 19 වර්ෂයට ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන පොලොන්නරුව මැදපත්තු දකුණු ගම්සභා සීමාවතුල පදිංචි ඕනෑම කෙනෙකු විරුද් වන්නේ නම් තමතමන්ගේ විරුද්ධත්ව ප්‍රකාශණ (කරුණු සහිතව) පිටපත් දෙක බැගින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධවූ දින සිට දින 14 ඇතුලතදී මා වෙත ඉදිරිපත් කරන ලෙසත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. බී. උඩුගොඩගේ,
මැදපත්තු දකුණු ගම්සභාවේ සභාපති තැ

1965.12.20 වන දින,
කඳුරුවෙල මුස්ලිම්කොළණියේ,
ගම්සභා කායඨාලයේ දීය.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ පිළිවෙල | වෙළඳාම කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | අලියාර් මොහමඩ් ලෙබ්බෙ; නො. 14, මුස්ලිම්කොළණිය, කඳුරුවෙල | එළහරක් මස් හා එළු මස් ... | මුස්ලිම්කොළණිය |
| 2. | ඒ. එල්. එම්. මුස්තපා, නො. 18, මුස්ලිම්කොළණිය, කඳුරුවෙල ... | එළහරක් මස් හා එළු මස් ... | මුස්ලිම්කොළණිය |
| 3. | ඒ. සී. ඒ. පතුල්ලා, නො. 62, මුස්ලිම්කොළණිය, කඳුරුවෙල ... | එළහරක් මස් හා එළු මස් ... | නො. 62, මුස්ලිම්කොළණිය (එළහරක් මස්) නො. 11, මුස්ලිම්කොළණිය (එළු මස්) |
| 4. | අලියාර් මොහමඩ් අබූෂාලි, නො. 62/ඒ, මුස්ලිම්කොළණිය, කඳුරුවෙල | එළහරක් මස් හා එළු මස් ... | මුස්ලිම්කොළණිය |
| 5. | ඇම්. අහමඩ් ලෙබ්බෙ, නො. 95, මානික්කම්පිටිය පාර, මානික්කම් පිටිය, කඳුරුවෙල | එළහරක් මස් ... | මානික්කම්පිටිය |
| 6. | ඇම්. ෂාහුල් හමීඩ්, නො. 11, මුස්ලිම්කොළණිය, කඳුරුවෙල .... | එළු මස් ... ... | මුස්ලිම්කොළණිය |

1–74—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## කටාන ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛණයෙහි නම් සඳහන් අයවළුන් විසින් එකී නම් වලට කෙළින් සඳහන්කර ඇති ස්ථානයන්හි 1966 වර්ෂය තුළ මස්කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින් එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කාරණයක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දවස් 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව 272 වෙනි පරිච්ඡේදයෙහි වූ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (ගෝ ඝාතක) ආඥාපණතේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | පිහිටි ස්ථානය |
|---|---|---|
| 1. | ටී. ඇන්තනි ප්‍රනාන්දු ... | නැගෙනහිර කටාන මස් කඩය. |
| 2. | ඇම්. ඇම්. ඉස්මායිල් ... | කටුවපිටිය මස් කඩය. |

ඇම්. ඇස්. අයිවන් ද සිල්වා,
කටාන ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කායඨාලය,
කටාන, 29.12.1965.

1–45—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## වරකාපොල සුළු නගර සභාව

### 1966 වර්ෂයට දේපල බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වෙනි අධිකාරය)

සුළු නගර සභා ආඥාපනත (256 වෙනි අධිකාරය) යටතේ ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයටද එසේම පැනවීමට වරකාපොල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශනයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට (6) හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වෙනිදයින්, ජූනි 30 වෙනිදයින්, සැප් තැම්බර් 30 වැනිදයින් සහ දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

වයි. ඇම්. මන්සූර්,
සභාපති,
සුළු නගර සභාව, වරකාපොල.

1965 දෙසැම්බර් 24 වෙනි දින,
වරකාපොල සුළු නගර සභා කාර්යාලයේ දීය.

1–56—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

---

## වරකාගොඩ පළාත ගම් සභාව—කළුතර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1966 වර්ෂයට බල පත්‍ර ඉල්ලුම් කරතිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන වරකාගොඩ පළාත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිලි පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවනා දින සිට දින දහ හතරක් ඇතුලත මා වෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිත වූ අංක 6 දරණ පණත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ ඇල්. ඇම්. මව්රූප් ... වේයන්ගල්ල, අගලවත්ත | හරක් මස් ... | අද්දර වත්ත, වේයන්ගල්ල |
| 2. | ඒ. සී. ඇම්. පසීර්, ... | හරක් මස් ... | හිරිකඳන දෙණිය, වේයන්ගල්ල |

හර්මන් කන්නන්ගර,
සභාපති,
වරකාගොඩ පළාත ගම්සභාව.

1965 දෙසැම්බර් මස 22 වැනි දින,
වරකාගොඩ පළාත
ගම්සභා කාර්යාලයේ දී ය.

1–124—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

## උඩිස්පත්තුව උතුර ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් ගවමස් විකිණීම පිණිස 1966 වර්ෂයට වෙළඳ බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධව උඩිස්පත්තුව උතුර ගම් සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ නියා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යයි, දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 දිනකක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ 273 පරිච්ඡෙදයේ අංක 7 (2) හා 1947 අංක 44 දරණ ආඥපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දනුම් දෙමි.

ර. ම. සු. වෛද්‍යරත්න,<br>
උඩිස්පත්තුව උතුර ගම්සභාවේ ප්‍රධාන තැන.

ගම්සභා කාර්‍යාලය,<br>
උඩිස්පත්තුව, 1965.12.29.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| ඇම්. ඒ. කාදර්, උඩිස්පත්තුව ... | උඩිස්පත්තුව, රත්ගල පාර, අංක 133 දරණ ස්ථානයේ. ... | ගවමස් විකිණීම |

1-60—66.1.7 දින අංක 14,613 දරණ ගැසට් පත්‍රය

---

## මැදපලාත ගම්ප්‍රදේශයේ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1966 වර්ෂයට සතුන් මරා මස් විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්වා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡෙදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ මැදපලාත ගම්ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යනාවග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මාංවත එවියයුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. එච්. ඇම්. තාසිම් ... | ... සතුන් මැරීම හා මස් වෙළඳාම | ... කැටකාලගහවත්ත, ඉහළ කොට්ටරාමුල්ල |
| 2. ඇම් ඇම්. යාසිම් ... | ... සතුන් මැරීම හා මස් වෙළඳාම | ... බැඳුරුව වත්ත හා පල්ලිය ගොඩැල්ල, ඉහළ කොට්ටරාමුල්ල |
| 3. ඇම්. එච්. අන්තෝනි අප්පුහාමි | ... සතුන් මැරීම හා මස් වෙළඳාම | ... අඹගහවත්ත, මුදුකටුව |
| 4. ඒ. ඒ. මජීදු ... | ... සතුන් මැරීම හා මස් වෙළඳාම | ... නිදිකුම්බවත්ත, ඉහළ කොට්ටරාමුල්ල |
| 5. ඇස්. ඇම්. ජුනයිදීන් ... | ... හරකුන් සහ එළුවන් මැරීම | ... දඹුවමූකලාන ඉඩම, පිළාකටුමුල්ල |
| 6. ඇස්. වර්සේ ඉබ්රාහිම් | ... සතුන් මැරීම හා මස් විකිණීම | ... කහටගහවත්ත සහ තිත්තගහකොටුව, ඉහළ කොට්ටරාමුල්ල |

ඇස්. මොහොමඩ් සාලි,<br>
මැදපලාත ගම්සභාවේ සභාපති.

1965.12.30, ගම්සභා කාර්‍යාලය,<br>
කබෝව, නාත්තන්ඩිය.

1-58—66.1.7 දින අංක 14,613 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත සඳහන් උපාලේඛණයෙහි නම් සඳහන් අයවලුන් විසින් එහි සඳහන් ස්ථානවල 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන, ඉබ්බාගමුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යනු වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. උසනා අල්ලා පිච්චේ, කුඹල්අංග, ඉබ්බාගමුව | ... එළහරක් මස් කඩය | ... කුඹල්අංග ගමේ, දිවුල්ගහමුල වත්ත |
| 2. ඇම්. මීරා ලෙබ්බේ, ගුරුමඩ, පානගමුව | ... එළහරක් මස් කඩය | ... බක්මීගොල්ල ගමේ, කෝන්ගහමුල වත්ත |

ඒ. ආර්. මොහමඩ් අලි,<br>
ඉබ්බාගමුව ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්‍යාලය,<br>
ත්නල,<br>
ඉබ්බාගමුව, 1965.12.28.

1-49—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය.

---

## උඩඩියන්කුලම කෝරළේ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය, එහි සඳහන් ස්ථානවල 1966 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව 272 වැනි අධිකාරය වන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන උඩඩියන්කුලම කෝරළේ ගම් සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමණ කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුලත දී මා වෙත ඉදිරිපත් කළ යුතු බව දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළෙඳම |
|---|---|
| 1. කේ. ඇම්. මහමදු ලෙබ්බේ ... | අනුරාධපුර පාර, කහටගස්දිගිලිය |

කේ. වී. පින්හාමි,<br>
ප්‍රධාන තැන,<br>
උඩඩියන්කුලම කෝරළේ ගම්සභාව.

ගලෙන්බිඳුනුවැව,<br>
1965.12.27.

1-48—66.1.7 දින අංක 14,613 දරන ගැසට් පත්‍රය

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය සිට සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ

5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමයට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝෂ වළක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් කර එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්වෙන්ව පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නියුක්ත කළයුතුයි කියා ගෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ ඇත.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 0 | ... | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුලබේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... | 0 60 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | ... | 0 15 |

දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම හැර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.